# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# මධ්‍යම පළාතේ – පළාත් සභාව

(පළාත් පාලන, අධ්‍යාපන, කර්මාන්ත
හා සත්ව නිෂ්පාදන අමාත්‍යාංශය)

මධ්‍යම පළාතේ – පළාත් සභාවේ – 1990
අංක 03 දරණ අධ්‍යාපන
ප්‍රඥප්තිය

(1990.05.28 දින ගරු ආණ්ඩුකාරතුමා
විසින් අනුමත කරන ලදී.)

මධ්‍යම පළාතේ – පළාත් සභාවේ නියමය පිට
මුද්‍රණය කරන ලදි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
මධ්‍යම පළාතේ – පළාත් සභාව

(පළාත් පාලන, අධ්‍යාපන, කර්මාන්ත,
හා සත්ව නිෂ්පාදන අමාත්‍යාංශය)

මධ්‍යම පළාතේ – පළාත් සභාවේ –
1990 අංක. 03 දරණ අධ්‍යාපන ප්‍රඥප්තිය.

1990 ක් වූ මැයි මස 08 වෙනි දින පැවැති
මධ්‍යම පළාතේ – පළාත් සභා රැස්වීමේ දී සම්මත වූ
බැව් සහතික කරමි.

සභාපති,
මධ්‍යම පළාත් සභාව.

# මධ්‍යම පළාතේ – පළාත් සභාවේ – 1990 අංක 03 දරණ අධ්‍යාපන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ නව වන උප ලේඛණයේ I වන ලැයිස්තුවේ අංක 3 හා III වන පරිශිෂ්ඨය යටතේ මධ්‍යම පළාත් සභාවට පවරා ඇති අධ්‍යාපන විෂයයට අදාල බලතල ක්‍රියාත්මක කිරීම සඳහා විධි විධාන සැලසීම් වස් මධ්‍යම පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව සංස්ථාපනය කිරීම සඳහා වූ ප්‍රඥප්තිය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 3 දරණ අධ්‍යාපන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබන දින සිට ක්‍රියාත්මක වන්නේය.
2. මෙම ප්‍රඥප්තියේ විධි විධානයන් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවක්, අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙක්, අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා ඒ ඒ අවස්ථාවල දී පත් කෙරෙන අනෙකුත් නිලධාරීන්ගෙන් යුක්තව ස්ථාපනය කෙරේ.

3. (i) අධ්‍යාපන විෂය භාර ඇමතිවරයාගේ, පාලනයට හා විධානයන්ට යටත්ව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සහ අනෙකුත් නිලධාරීන් විසින්, මෙම ප්‍රඥප්තිය යටතේ හා වරින් වර ඒ යටතේ සාදනු ලබන රෙගුලාසි යටතේ වන විධි විධාන හා බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැක්කේය.

(ii) මෙම ප්‍රඥප්තියේ විධි විධානයන් හා ඒ යටතේ සාදනු ලබන රෙගුලාසි යටතේ, අධ්‍යක්ෂ විසින් ගනු ලබන තීරණයන් හෝ තීරණ තමා වෙත කරනු ලැබූ අභියාචනයක් ප්‍රකාරව හෝ, එසේ නොමැතිව හෝ වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ අත්හිටුවීමට හෝ තම අභිමතය පරිදි අමාත්‍යවරයාට හැක්කේ ය. එසේ කරනු ලබන වෙනස් කිරීම, සංශෝධනය හෝ අත්හිටුවීම, නීත්‍යානුකූල වන අතර, ප්‍රස්තුත කරුණට අදාල සියළු පාර්ශ්වයන් අමාත්‍යවරයාගේ තීරණය අවසාන තීරණය ලෙස පිළිගැනීමට බැඳී සිටී.

## I වන කොටස

මධ්‍යම පළාතේ අධ්‍යාපන උපදේශ කමිටුව, ප්‍රාදේශීය අධ්‍යාපන උපදේශක කමිටු හා පාසල් බද අධ්‍යාපන උපදේශක මණ්ඩල ප්‍රතිෂ්ඨාපනය කිරීම.

4. (1) ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟතාවය මත මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් හත් (7) දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් යුක්ත වන්නා වූ පළාත් අධ්‍යාපන උපදේශක මණ්ඩලයක් ප්‍රතිෂ්ඨාපනය කරනු ලැබේ.

(2) අමාත්‍යවරයා විසින් පළාත් අධ්‍යාපන උපදේශක මණ්ඩලයේ සභාපති ලෙස අමාත්‍යාංශයේ ලේකම්වරයා නම් කරනු ලැබිය යුත්තේය.

(3) මණ්ඩලයේ ලේකම් ලෙස අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධරයෙක් අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය හැක්කේය.

(4) මණ්ඩලය විසින් යෝග්‍යයයි සලකනු ලබන හෝ, ඇමතිවරයා විසින් කමිටුව වෙත යොමු කරනු ලබන, අධ්‍යාපන විෂයයට අදාල වූ කරුණු පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් ලබාදීම මණ්ඩලයේ කාර්යභාරය වන්නේය.

(5) මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම, එහි කටයුතු හා කාර්ය පරිපාටිය, බලතල හා විෂය සීමාවන් පිළිබඳ පළාත් සභාවේ අනුමැතිය ලබන විධි විධානයන් ගරු ඇමතිතුමා විසින් සාදනු ලබන්නේය.

(6) ප්‍රධාන ඇමතිතුමාගේ එකඟත්වය ඇතිව මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිවරයාට මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකු ඕනෑම අවස්ථාවක සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට හැකි අතර, මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යවරයා වෙත යවන ලිඛිත දැන්වීමකින් සාමාජිකත්වයෙන් ඉවත් වීමට සාමාජිකයකුට හැකිය.

(7) නියමිත කාලසීමාවට පෙර තනතුරෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ධුරය අතහැර ගියහොත් හෝ මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිවරයා විසින් තනතුරෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස උපදේශක මණ්ඩලයේ සෑම සාමාජිකයකුම ඔහු පත්කරනු ලැබූ දින සිට අවුරුදු 02 ක කාලයක් (6) වන උප වගන්තියේ, විධි විධානවලට යටත්ව ධුරය දැරිය යුත්තේය.

(8) අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල යම් නිශ්චිත කාර්යයක් ඉටුකිරීම සඳහා ද පළාත් අධ්‍යාපන උපදේශක මණ්ඩලයට අයත් ඕනෑම කර්තව්‍යයක් එම උපදේශක මණ්ඩලයේ සාමාන්‍ය මග පෙන්වීම හා පාලනයට යටත්ව හා එසේ පත්කරනු ලබන අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල යම් කර්තව්‍යයක් ඉටුකිරීම සඳහා ද ප්‍රාදේශීය අධ්‍යාපන උපදේශක කමිටු පත්කිරීමට පළාතේ අධ්‍යාපන උපදේශක මණ්ඩලයට හැක්කේය.

5. (1) අධ්‍යාපන විෂයයට අදාල අවශ්‍යතා හා, ප්‍රාදේශීය අධ්‍යාපන කොට්ඨාශ හා සම්බන්ධ කරුණු පිළිබඳව අධ්‍යක්ෂවරයාට උපදෙස් සැපයීම සඳහා ප්‍රාදේශීය උපදේශක කමිටු ඇමතිවරයා විසින් පත්කළ හැක්කේය.

(2) ප්‍රාදේශීය උපදේශක කමිටු පහත සඳහන් සාමාජිකයන්ගෙන් යුක්ත වන්නේය.

(අ) සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (කොට්ඨාශය භාර)

(ආ) කොට්ඨාශය තුළ පිහිටි මහ නගර සභාවල නගරාධිපති, නගරසභාවල සභාපතිවරුන්, ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන්.

(ඇ) කොට්ඨාශය තුළ පිහිටි මහ නගර සභාවල නාගරික කොමසාරිස්, නගර සභා ලේකම්, ප්‍රාදේශීය ලේකම්වරුන්.

(ඈ) සහකාර අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන විදුහල්පතිවරුන් තිදෙනෙක්.

(ඉ) අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන පස් දෙනකුට නොවැඩි ශිෂ්‍ය නායකයන් සංඛ්‍යාවක්.

(3) සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ප්‍රාදේශීය අධ්‍යාපන උපදේශක කමිටුවේ සභාපති විය යුත්තේය.

(4) කමිටුවේ ප්‍රථම රැස්වීමේ දී මණ්ඩලයේ ලේකම් ධුරයට සාමාජිකත්වයෙන් අයකු තෝරා පත්කර ගත හැක්කේය.

(5) ප්‍රාදේශීය උපදේශක කමිටු රැස්විය යුතු හා කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව නියම කරනු ලබන විධි විධානයන් අනුගමනය කළ යුතු අතර, අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ විසින් කමිටුවේ අවධානය සඳහා යොමු කරනු ලබන කරුණු පරීක්ෂා කර සිය උපදෙස් ලබා දිය යුතුය.

(6) අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ විසින් කමිටුවේ අවධානය පිණිස යොමු කරනු ලබන අධ්‍යාපන විෂයයට අදාල වූ කරුණු පිළිබඳව තම උපදෙස් ලබාදීම හා තම නිර්දේශ ඉදිරිපත් කිරීම හැර කිසිදු විධායක හෝ පරිපාලනමය බලතලයක් කමිටුවට හිමි නොවේ.

(12)

6. (1) මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කරනු ලබන නියමයන්ට අනුකූලව පළාතේ සෑම පාසලක් සඳහාම පාසල් උපදේශක මණ්ඩලයක් ප්‍රතිෂ්ඨාපනය කෙරේ.

(2) අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ විසින් අදාල පාසලේ, කළමනාකරණය, සංවිධානය, සංවර්ධනය හා පැවැත්ම අරහයා යොමු කරනු ලබන කරුණුවලට අදාලව හා තම උපදෙස් ලබාදීම සුදුසු යැයි, අදහස් කරනු ලබන කරුණුවලට අදාලව උපදෙස් ලබාදීම පාසල් උපදේශක මණ්ඩලයේ කාර්යභාරය වන්නේය.

(3) පාසල් උපදේශක මණ්ඩලයට විධායක හෝ පරිපාලනමය බලතල කිසිවක් හිමි නොවන්නේය.

(4) පාසල් උපදේශක මණ්ඩලය, පාසල් විදුහල්පති, ආචාර්‍ය මණ්ඩලයේ සාමාජිකයන්, දෙගුරුන් හා භාරකරුවන්ගෙන් යුක්ත වන්නේය.

(5) විදුහල්පති, පාසල් උපදේශක, මණ්ඩලයේ සභාපති වන්නේය.

(6) පාසල් උපදේශක මණ්ඩලයේ ප්‍රථම සභා රැස්වීමේ දී එම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය සඳහා විධායක කමිටුවක් පත්කර ගත යුතු වන්නේය.

7. තමන්ගේ හෝ තම දෙමාපියන්ගේ, ජාතිය, වර්ගය, කුලය, ආගම, සමාජ තත්ත්වය හෝ භාෂාව මත කිසිදු අයදුම්කරුවකු පළාතේ කිසිදු පාසලකට ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප නොකළ යුතුය.

8. ක්‍රියාත්මක වන ලිඛිත නීතියට අනුරූපව, ඕනෑම පෞද්ගලික ඉඩමක්, පාසල් ගොඩනැගිලි ඉදිකිරීම, ව්‍යාප්ත කිරීම, ගුරු නිවාස හා කාර්යාල ඉදිකිරීම් හා අධ්‍යාපන කාර්යයන්ට අදාල ඉදිකිරීම් වෙනුවෙන් හා පාසල් ක්‍රීඩාංගණ හා පාසල් ගොවිපළවල් සඳහා අත්පත් කර ගැනීමට පළාත් සභාවට හිමිකම් ඇත්තේය.

9. (1) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අධිකාරි බලය යටතේ වන කිසිදු පාසලකට ළමුන් ඇතුළත් කර ගැනීමේ දී මුදල් අයකිරීම නොකළ යුත්තේය.

(2) ඉහත (1) හි සඳහන් කාර්යයන්ට පරිබාහිරව පාසලකට බාහිර ක්‍රියාකාරකම් හා සේවා පවත්වා ගැනීම සම්බන්ධයෙන් වූ යම් වියදමක් දැරීමට ඒ සඳහා ළමුන්ගේ පහසුකම් ගාස්තුවක් ලෙස යම් මුදලක් අයකර ගැනීමට ඉඩකඩ සැලසීමට අවශ්‍ය රෙගුලාසි මෙම ප්‍රඥප්තියට අදාලව පනවනු ලැබිය හැකිය.

10. අමාත්‍යවරයා විසින් හෝ අධ්‍යක්ෂ විසින් හෝ අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ හෝ අධීක්ෂණ නිලධාරියකු හෝ ඇමතිවරයා හෝ අධ්‍යක්ෂ විසින් බලය පවරනු ලබන වෙනත් ඕනෑම අයකු හෝ ඕනෑම විදුහලක ක්‍රියාකාරිත්වය හෝ විදුහලේ වත්කම් හෝ එහි ඇතුලත්ව පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

11. එසේ නොවන බව ඔප්පු කරනු නොලබනතාක්, යම් ළමයකු සාමාන්‍යයෙන් නැවතී සිටින ස්ථානයේ පදිංචිකරුවාට එම ළමයාගේ නියම භාරකාරත්වය හිමිවන බව සළකනු ලැබේ.

## II කොටස

## ප්‍රඥප්තියට අදාල රෙගුලාසි සෑදීමට ඇමතිවරයාට ඇති බලය

12. (1) මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධි විධානයන් ක්‍රියාත්මක කිරීමට අදාල වන්නා වූ නියෝග නමින් හැඳින්වෙන්නා වූ රෙගුලාසි අමාත්‍යවරයා විසින් පැණවිය හැක්කේය.

(2) පහත සඳහන් කරුණුවලට අදාලව අමාත්‍යවරයා විසින් විශේෂයෙන් රෙගුලාසි පැනවිය හැක්කේය.

i. පළාතේ, ජාතික පාසල්, ආරක්ෂක සේවා සඳහා වූ විශේෂිත පාසල්, විශේෂිත සංවර්ධන පරිපාටීන්ට අදාල වූ පාසල් හැර අනෙකුත් පාසල් සඳහා පහසුකම් සැලැස්වීම.

ii. ඉහත (1) හි සඳහන් පාසල් හැර සියලුම පෙර පාසල් හා පාසල්වල කළමනාකාරීත්වය අධීක්ෂණය කිරීම.

iii. ගුරු වෘත්තියට හා අධ්‍යාපන සේවා සඳහා පුද්ගලයන් බඳවා ගැනීම.

iv. 1 ඒ, බී, සී, වර්ගවල පාසල් හැර අනෙක් සියළුම රජයේ පාසල්වල විදුහල්පතිවරුන් පත්කිරීම.

v. අධ්‍යාපනයට අදාල සියළු නිලධාරීන් පරිපාලනය හා ස්ථාන මාරු කිරීම.

vi. පළාත් අධ්‍යාපන සංවර්ධන සැලැස්ම හා ප්‍රාදේශීය අධ්‍යාපන සංවර්ධන සැලැස්ම සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

vii. වාර්ෂික අධ්‍යාපන සංවර්ධන සැලැස්ම සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

viii. අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන්, විදුහල්පති, ගුරුවරුන්ට අදාල කාර්යය සාධනය ඇගයීම.

ix. ජාතික අධ්‍යාපන ආයතනයේ පූර්ව අනුමැතිය ලබා ගෙන සේවස්ථ පුහුණු වැඩ සටහන් පැවැත්වීම.

x. විභාග කොමසාරිස්ගේ අනුමැතිය ලබන ප්‍රාදේශීය විභාග පැවැත්වීම.

xi. නොවිධිමත් අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

xii. පෙර පාසල් ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය.

xiii. ද්විතීය අධ්‍යාපන විෂය මාලාවන් තෝරාගත් විෂයයන් හා ප්‍රාථමික විෂය මාලාවන්, ජාතික අධ්‍යාපන ආයතනයේ උපදෙස් අනුව සැකසීම.

xiv. පාසල් ගොඩනැගිලි, පුස්තකාල, ක්‍රීඩාංගන ඉදිකිරීම හා නඩත්තුව.

xv. පාසල් ලීබඩු උපකරණ, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ, ඉගැන්වීමේ ආධාරක උපකරණ හා අනෙකුත් උපකරණ සපයා දීම හා බෙදාහැරීම.

xvi. විද්‍යා උපකරණ සපයා දීම හා බෙදාහැරීම.

xvii. මධ්‍යම ආණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව පාසල් පොත් මුද්‍රණය හා බෙදාහැරීම.

xviii. ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ උපමාණයන්ට අනුව පාසල් පුස්තකාල සංවිධානය හා සංවර්ධනය කිරීම.

xix. කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල බල ප්‍රදේශවල සීමා තීරණය කිරීම.

xx. පාසල්වල ළමුන් ඇතුළත් කර ගැනීම, විෂයමාලා නිර්දේශ, අතිරේක කියැවීම් පොත් නිර්දේශ කිරීම.

xxi. පාසල් වාර කාල සටහන්, පාසල් නිවාඩු තීරණය කිරීම.

xxii. සෞඛ්‍ය පරීක්ෂණ, පිළියම් යෙදීම, ශිෂ්‍ය සුභ සාධනය, දිවා ආහාරය හා නොමිළේ පොත් ලබාදීම.

xxiii. ජාතික අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන ප්‍රතිපත්ති හා ප්‍රමිතීන්ට අනුකූලව පාසල් ආරම්භ කිරීම හා ශ්‍රේණිගත කිරීම – උසස් කිරීම.

xxiv. වැඩිහිටි අධ්‍යාපනයට අදාල සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම,

xxv. අධ්‍යාපනයට අදාල පළාත් අයවැය සැකසීම, අධීක්ෂණය හා කළමනාකරණය

xxvi. අධ්‍යාපන විෂයයට අදාල යැයි ඇමතිවරයා විසින් අනුගමනය කරනු ලබන වෙනත් කරුණු.

12. (3) මෙම ප්‍රඥප්තියට අදාලව සාදනු ලබන රෙගුලාසි හා නියෝග ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය හා පළාත් සභාවේ අනුමැතිය ලැබූ පසු නීත්‍යානුකූල වන්නේය.

## III කොටස
## සාමාන්‍ය

13\. (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියෙහි "ආණ්ඩුකාරවරයා" යන්නෙන් මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ.

"ප්‍රධාන අමාත්‍යවරයා" යන්නෙන් මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් මධ්‍යම පළාතේ අධ්‍යාපන විෂය භාර ඇමතිවරයා අදහස් වේ.

"ලේකම්" යන්නෙන් මධ්‍යම පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් අදහස් වේ.

"දෙපාර්තමේන්තුව" යන්නෙන් මධ්‍යම පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව අදහස් වේ.

"අධ්‍යක්ෂ" යන්නෙන් මධ්‍යම පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ද, ඔහුගේ විධානයන් යටතේ මෙම පනතින් අධ්‍යක්ෂවරයාගේ බලතල ක්‍රියාත්මක කරන්නා වූ දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙක් අදහස් කෙරේ.

"අතිරේක අධ්‍යක්ෂ" යන්නෙන් මධ්‍යම පළාතේ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයකු අදහස් කෙරේ.

"සහකාර අධ්‍යක්ෂ" යන්නෙන් කොට්ඨාශ භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ-වරයෙක් අදහස් කෙරේ.

"පළාත් උපදේශක කමිටුව" යන්නෙන් 4 (1) යටතේ පිහිටවනු ලබන පළාත් උපදේශක කමිටුව අදහස් කෙරේ.

"ප්‍රාදේශීය උපදේශක කමිටුව" යන්නෙන් 5 (1) යටතේ පිහිටවනු ලබන ප්‍රාදේශීය උපදේශක කමිටුව අදහස් කෙරේ.

"පාසල් උපදේශක මණ්ඩල" යන්නෙන් 6 (1) යටතේ පිහිටවනු ලබන පාසල් මණ්ඩල අදහස් කෙරේ.

"අධ්‍යාපන අවශ්‍යතා" යන්නෙන් ප්‍රමාණවත් අධ්‍යාපන හා තාක්ෂණ පුහුණුව-කට අදාල පහසුකම් අදහස් කෙරේ.